# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013
(නව නිර්දේශය)
2016 අගෝස්තු - ඔක්තෝබර්

### සමාජීය විද්‍යා පීඨය

### මනෝවිද්‍යාව - PSYC - E 3015

### සමාජ චර්යාව පිළිබඳ මනෝවිද්‍යාව

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "සමාජ චර්යාව පිළිබඳ මනෝවිද්‍යාව යනු පුද්ගලයාගේ ක්‍රියාවන්, හැඟීම් හා සිතුවිලි කෙරෙහි සමාජ බලපෑම අධ්‍යයනය කිරීමකි". පහදන්න.

02. "සමාජ චර්යා මිනිසුන්ට පමණක් නොව අනෙකුත් සත්ත්වයන්ට ද ආවේනික වී ඇත්තේ පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය වන නිසාය." මේ ප්‍රකාශය සැලකිල්ලට ගනිමින් සමාජ චර්යාවන්ගේ වැදගත්කම හා අවශ්‍යතාව පෙන්වා දෙන්න.

03. සමාජ ප්‍රජානනය තුළ ස්කිමාවන්ගේ (මනෝරටා) කාර්යයන් සනිදර්ශන ව පැහැදිලි කරන්න.

04. සමාජීය ලෝකය සංජානනයට අවාචික සන්නිවේදනයෙන් සිදුවන දායකත්වය අගයන්න.

05. හේතු දැක්වීම්වල (Attributions) හෝ ව්‍යංග්‍ය පෞරුෂ න්‍යායයන්ගේ (Implicit Personalty Theories) සමාජ මනෝවිද්‍යාත්මක අගය පෙන්වා දෙන්න.

06. ආකල්පයක අන්තර්ගතය පැහැදිලි කොට ආකල්ප වෙනස් කිරීමේ ක්‍රම ශිල්ප පිළිබඳ විමසීමක් කරන්න.

07. "සමාජ හිතකාමී චර්යාවන්ගේ පදනම සමාජීය ප්‍රතිලාභ (Social Rewards) වැඩි කිරීමය." පක්ෂ ව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

08. අගතිය (Prejudice) හා වෙන්කොට සැලකීම (Discrimination) අවම කිරීමෙහිලා උපයෝගී කරගත හැකි ප්‍රායෝගික ක්‍රමෝපායයන් යෝජනා කරන්න.

**********************